**හිමිකම් රක්ෂණ අරමුදල - 2016**

----------------------------------------

හිමිකම් රක්ෂණ අරමුදලේ 2016 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනය, ස්කන්ධය වෙනස් වීමේ ප්‍රකාශනය සහ මුදල් ප්‍රවාහ ප්‍රකාශනය හා වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ අනෙකුත් පැහැදිලි කිරීමේ තොරතුරුවල සාරාංශයකින් සමන්විත 2016 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 1998 අංක 21 දරන හිමිකම් ලියාපදිංචි කිරීමේ පනතේ 67 වන වගන්තිය යටතේ ඉඩම් හා ඉඩම් සංවර්ධන අමාත්‍යවරයා විසින් සාදන ලදුව 2009 අගෝස්තු 24 දිනැති අංක 1616/23 දරන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ අතිවිශේෂ ගැසට් පත්‍රයෙහි ප්‍රකාශයට පත්කරන ලද නියෝගවල 41 (1) නියෝගය සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154 (1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. යථෝක්ත මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

## 1.2 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ වගකීම

-----------------------------------------------------------------

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොරවූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

## 1.3 විගණකගේ වගකීම

-----------------------

මාගේ විගණනය මත පදනම්ව මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීම මාගේ වගකීම වේ. මා විසින් උත්තරීතර විගණන ආයතනයන්ගේ ජාත්‍යන්තර විගණන ප්‍රමිතිවලට (ISSAI 1000 – 1810) අනුරූප ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට අනුකූලව මාගේ විගණනය සිදුකරන ලදී. ආචාර ධර්මවල අවශ්‍යතාවන්ට මම අනුකූලවන බවට සහ මූල්‍ය ප්‍රකාශන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොරවන්නේද යන්න පිළිබඳ සාධාරණ තහවුරුවක් ලබා ගැනීම පිණිස විගණනය සැලසුම්කර ක්‍රියාත්මක කරන බවට මෙම ප්‍රමිති අපේක්ෂා කරයි.

මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන අගයන් සහ හෙළිදරව් කිරීම්වලට අදාළවන විගණන සාක්ෂි ලබා ගැනීම පිණිස පරිපාටි ක්‍රියාත්මක කිරීම විගණනයට ඇතුළත් වේ. තෝරාගත් පරිපාටීන්, වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් අවදානම් තක්සේරු කිරීම් ද ඇතුළත් විගණකගේ විනිශ්චය මත පදනම් වේ. එම අවදානම් තක්සේරු කිරීම්වලදී, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අරමුදලේ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට සහ සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාළ වන්නාවූ අභ්‍යන්තර පාලනය විගණක සැළකිල්ලට ගන්නා නමුත් අරමුදලේ අභ්‍යන්තර පාලනයේ සඵලදායීත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි. කළමනාකරණය විසින් අනුගමනය කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය හා යොදාගන්නා ලද ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය ඇගයීම මෙන්ම මූල්‍ය ප්‍රකාශනවල සමස්ත ඉදිරිපත් කිරීම පිළිබඳ ඇගැයීමද විගණනයට ඇතුළත් වේ.

මාගේ විගණන මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබා ගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් හා උචිත බව මාගේ විශ්වාසයයි.

## 1.4 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

----------------------------------------------

මෙම වාර්තාවේ 2.2 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ.

## 2. මූල්‍ය ප්‍රකාශන

### 2.1 තත්ත්වාගණනය කළ මතය

මෙම වාර්තාවේ 2.2 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර මූල්‍ය ප්‍රකාශනවලින් 2016 දෙසැම්බර් 31 දිනට හිමිකම් රක්ෂණ අරමුදලේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරිත්වය හා මුදල් ප්‍රවාහ ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නාවූ මතය වේ.

### 2.2 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

#### 2.2.1 ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිති

ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිති අංක 02 හි 32 හා 34 ඡේද ප්‍රකාරව මුදල් ප්‍රවාහ ප්‍රකාශනය පිළියෙල කිරීමේදී ආයෝජන ක්‍රියාකාරකමක් වූ භාණ්ඩාගාර බිල්පත්වල ආයෝජනය හා මෙහෙයුම් ක්‍රියාකාරකමක් වූ ආයෝජන පොළී වට්නාකම වෙන් වෙන්ව වාර්තා කර නොතිබුණි. තවද, සමාලෝචිත වර්ෂයේ රු. 9,901,616 ක් වූ අතිරික්තය මෙහෙයුම් ක්‍රියාකාරකම් යටතේ මුදල් ප්‍රවාහ ප්‍රකාශනයේ ඉදිරිපත් කිරීමට කටයුතු කර නොතිබුණි.

#### 2.2.2 ගිණුම්කරණ අඩුපාඩු

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) හිමිකම් ආදායම් රැස්කිරීමේ නිල බැංකු ගිණුමට බැංකුව විසින් හර කර තිබූ රු.253,770 ක් නිශ්චිතව හඳුනා ගෙන නොතිබුණි. ඒ හේතුවෙන් සියයට 40 ක් ලෙස අරමුදලට හිමි රු. 101,508 ක් හිමිකම් ලියාපදිංචි කිරීම ආදායම අඩුවෙන් ගිණුම් ගත කර තිබුණි.

(ආ) සමාලෝචිත වර්ෂයට අදාළ විගණන ගාස්තුව වූ රු. 79,920 ක් සඳහා වෙන් කිරීම් කර නොතිබුණි.

### 2.3 නීති රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම

පහත සඳහන් අනුකූල නොවීම් නිරීක්ෂණය විය.

| | නීති රීති හා රෙගුලාසි ආදියට යොමුව | අනුකූල නොවීම |
|---|---|---|
| (අ) | 2009 අගෝස්තු 24 දිනැති අංක 1616/23 දරන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ අතිවිශේෂ ගැසට් පත්‍රය මඟින් ප්‍රසිද්ධ කරන ලද 2009 අංක 01 දරන හිමිකම් ලියාපදිංචි කිරීමේ (රක්ෂණ අරමුදල්) නියෝග | |
| (i) | 9 නියෝගය | ශ්‍රී ලංකා මහ බැංකුවේ බැංකු අධීක්ෂණය භාරව සිටින අධ්‍යක්ෂවරයාගේ හා භාණ්ඩාගාර නියෝජ්‍ය ලේකම්ගේ උපදෙස් ලබා ගැනීමකින් තොරව 2011 වර්ෂයේ සිට 2016 දෙසැම්බර් 31 දක්වා කාලපරිච්ඡේදය තුළ |

භාණ්ඩාගාර බිල්පත් 53 ක රු. 25,620,078 ක් ආයෝජනය කර තිබුණි.

| | | |
|---|---|---|
| (ii) | 12 නියෝගය | වාර්ෂික විගණන වාර්තාව සමඟ පරිපාලන වාර්තාව ප්‍රකාශයට පත්කළ යුතු නමුත් 2010 වර්ෂයේ සිට පරිපාලන වාර්තාවක් පිළියෙල කර නොතිබුණි. |
| (iii) | 13 නියෝගය | ශ්‍රී ලංකා මහ බැංකුව නියෝජනය කරනු ලබන නියෝජිතයා සමාලෝචිත වර්ෂයේ පැවැත්වූ කළමනාකරණ මණ්ඩල රැස්වීම් වාර 03 සඳහාම සහභාගී වී නොතිබුණි. |
| (iv) | 15 (1) නියෝගය | මණ්ඩලයේ වාර්ෂික මහා සභා රැස්වීම සෑම වර්ෂයකම ජනවාරි මාසයේ පැවැත්විය යුතු වුවද අරමුදල ආරම්භ කළ 2010 වර්ෂයේ සිට සමාලෝචිත වර්ෂය දක්වාම මහා සභා රැස්වීම් පවත්වා නොතිබුණි. |
| (v) | 39 නියෝගය | අරමුදලේ ගෙවීම්, හිමිකම් රෙජිස්ට්‍රාර් ජනරාල්වරයා විසින් අනුමත කර සහතික කිරීමේ බලය අතිරේක හෝ නියෝජ්‍ය හිමිකම් රෙජිස්ට්‍රාර් ජනරාල්වරයකු වෙත පැවරිය යුතු වුවද, එලෙස බලය පැවරීමකින් තොරව නියෝජ්‍ය රෙජිස්ට්‍රාර් ජනරාල් විසින් ගෙවීම් අනුමත කර දෙපාර්තමේන්තුවේ ප්‍රධාන ගණකාධිකාරි විසින් ගෙවීම් සහතික කර සමාලෝචිත වර්ෂයේ දී ගෙවීම් වවුචර් 39 ක් මඟින් රු.14,379,061 ක් ගෙවීම් කර තිබුණි. |

## 3. මූල්‍ය සමාලෝචනය

### 3.1 මූල්‍ය ප්‍රතිඵල

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා අරමුදලේ මූල්‍ය ප්‍රතිඵලය රු.9,901,617 ක අතිරික්තයක් වූ අතර, ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ අතිරික්තය රු.7,269,267 ක් වූයෙන් ඉකුත් වර්ෂයට සාපේක්ෂව සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රතිඵලයෙහි රු.2,632,350 ක වර්ධනයක් පෙන්නුම් කෙරුණි. හිමිකම් ලියාපදිංචි කිරීමේ ආදායම රු.2,065,610 කින් හා ආයෝජන පොළී ආදායම රු.875,192 කින් ඉහළයාම එම වර්ධනයට ප්‍රධාන වශයෙන් බලපා තිබුණි.

සමාලෝචිත වර්ෂයේ සහ ඉකුත් වර්ෂ 05 ක මූල්‍ය ප්‍රතිඵල විග්‍රහ කිරීමේදී අරමුදල ආරම්භ කළ 2010 වර්ෂයේදී රු.800,515 ක් වූ මුළු ආදායම සමාලෝචිත වර්ෂය වන විට රු.10,524,201 ක් දක්වා අඛණ්ඩව වර්ධනය වී තිබුණි.

## 4. මෙහෙයුම් සමාලෝචනය

------------------------------

### 4.1 කාර්යසාධනය

---------------

2009 අගෝස්තු 24 දිනැති අංක 1616/23 දරන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයේ පල කරන ලද නියෝගවල සඳහන් පරිදි මෙම අරමුදලේ අරමුණ, ඉඩමක හිමිකම් සම්බන්ධතාවය පිළිබඳ වංචනික හෝ වැරදි සහගත හිමිකම් ලියාපදිංචිය සම්බන්ධයෙන් සිදුවන හානි පූර්ණය සඳහා වන්දි ගෙවීම විය. ඒ පිළිබඳව පොදු ජනතාව දැනුවත් වී නොතිබූ අතර අරමුදල ආරම්භකර තිබූ 2010 මාර්තු 01 දින සිට සමාලෝචිත වර්ෂය අවසානය දක්වාම කිසිදු හානිපූර්ණ වන්දියක් ගෙවා නොතිබුණි.

### 4.2 කළමනාකරණ ක්‍රියාකාරකම්

--------------------------------

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) හිමිකම් ආදායම් රැස්කිරීමේ බැංකු ගිණුමට බැරකර තිබූ රු. 2,472,400 ක ආදායමක්, ආදායම් වාර්තා සමඟ සසඳා බැරකර ඇති වටිනාකමේ නිවැරදිතාවය හඳුනා නොගෙන එම ආදායමින් අරමුදලට හිමි සියයට 40 ක් වූ රු.988,960 ක ප්‍රමාණයක් සමාලෝචිත වර්ෂයේ හිමිකම් රක්ෂණ අරමුදලේ ආදායම් වශයෙන් ගිණුම් ගත කර තිබුණි.

(ආ) ආදායම් වාර්තා නියමිත පරිදි සසදා නොතිබීම, ගිණුම් පොත්පත් හා මූල්‍ය ප්‍රකාශනවල අඩුපාඩු පැවතීම යනාදී කරුණු හේතුවෙන් කාර්යය මණ්ඩලය නිසි සැලකිල්ලකින් යුතුව කටයුතු කළ බවට විගණනයේදී සෑහීමකට පත්විය නොහැකි විය. එහෙත් අරමුදලේ රාජකාරි ඉටුකිරීම වෙනුවෙන් කාර්ය මණ්ඩලය සඳහා සමාලෝචිත වර්ෂයේ රු. 334,955 ක දීමනා ගෙවා තිබුණි.

## 5. ගිණුම් කටයුතුභාවය සහ යහපාලනය

-----------------------------------------

### 5.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම

------------------------------

2006 දෙසැම්බර් 22 දිනැති අංක පීඑෆ්/423 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛ උපදෙස් ප්‍රකාරව ගිණුම් වර්ෂය අවසාන වී මාස 02 ක් ඇතුළත අරමුදලේ මූල්‍ය ප්‍රකාශන හා කාර්යයසාධන වාර්තාව විගණකාධිපති වෙත ඉදිරිපත් කළ යුතු වුවද, 2016 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන 2017 මාර්තු 30 දින විගණකාධිපති වෙත ඉදිරිපත්කරන ලද නමුත් සකස් කිරීමේ දෝෂ හේතුවෙන් ඉවත් කර ගන්නා ලද එම මූල්‍ය ප්‍රකාශන නැවත මාස 09 ක කාල ප්‍රමාදයකින් පසුව 2017 දෙසැම්බර් 28 දින ඉදිරිපත් කර තිබුණි.

### 5.2 අභ්‍යන්තර විගණනය

----------------------

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහයේ මුදල් රෙගුලාසි 133 ප්‍රකාරව අරමුදලේ කටයුතු සම්බන්ධයෙන් අභ්‍යන්තර විගණනයක් සිදුකර නොතිබුණි.

### 5.3 අයවැය ලේඛනමය පාලනය

--------------------------------

2016 අගෝස්තු මස සංශෝධිත අයවැය ලේඛනයක් පිළියෙල කර තිබුණද ඒ සඳහා විෂයභාර අමාත්‍යවරයාගේ අනුමැතිය ලැබී නොතිබුණි. අනුමත කර තිබූ මුල් අයවැය ලේඛනයේ අයවැයගත හා තත්‍ය ආදායම අතර සියයට 50 ක විචලනයක් ද, අයවැයගත හා තත්‍ය වියදම අතර සියයට 47 ක විචලනයක් ද, පැවතීම හේතුවෙන් අරමුදලේ අයවැය ලේඛනය ඵලදායී කළමනාකරණ පාලන

කාරකයක් ලෙස භාවිතා කර නොතිබූ බව නිරීක්ෂණය විය. තවද, ඉදිරිපත් කළ මූල්‍ය ප්‍රකාශනවල අයවැයගත ඇස්තමේන්තු ලෙස අනුමත නොකරන ලද සංශෝධිත අයවැයගත අගයන් ඇතුළත් කළ විචලනයන් දක්වා තිබුණි.

## 6. පද්ධති හා පාලනයන්

-------------------------

විගණනයේදී නිරීක්ෂණය වූ පද්ධති හා පාලන අඩුපාඩු වරින්වර රෙජිස්ට්‍රාර් ජනරාල්වරයාගේ අවධානයට යොමු කරන ලද අතර කාර්යසාධන වාර්තා සකස් කර ප්‍රගතිය සමාලෝචනය කිරීම සහ ගිණුම් පොත්පත් ක්‍රමානුකූලව පවත්වා නියමිත දින මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම කෙරෙහි විශේෂ අවධානය යොමු කළ යුතුය.